**සාරය:** සුමිහිරි දරුවනි, මම සැමවිටම ශබ්දය අභිබැවූ කෙනෙක්මි. මා පැමිණියේ ඔබ දරුවන්ව ශබ්දය අභිබවා ගෙන යාමටයි. දැන් මේ ඔබ සියලු දෙනාගේම විශ්‍රාමික අවධියයි. ඔබලාට දැන් ශබ්දය අභිබැවූ නිවහනට යාමට තිබේ.

**ප්‍රශ්නය:** ඔබ හොඳ උත්සාහවන්ත ශිෂ්‍යයන්ව ආමන්ත්‍රණය කරන්නේ කවුරුන් කියා ද?

**පිළිතුර:** හොඳ උත්සාහවන්ත දරුවෙක් තමා සමගම කතා කිරීමට දනී, එසේම සූක්ෂම අයුරින් ඉගෙන ගැනීමටත් දනී. උත්සාහවන්ත ශිෂ්‍යයන්: කුමක් හෝ නපුරු ගති ගුණයක් තමා තුළ තිබේද ? කොපමණ තරමින් මා දිව්‍යමය ගුණධර්ම උකහාගෙන තිබේද ? තමන් තුළ කුමක් හෝ සාපරාධී සිතිවිලි ඇත්ද ? ආදී වශයෙන් නොකඩවා තමන්ව පරීක්ෂා කරති. ඔවුන් කොපමණ තරමට නිරන්තරව සහෝදර බැල්ම තබා ඇත්ද යන්න බලාගැනීමට ඔවුන්ටම වාර්තාවක් තබා ගනු ඇත.

ඕම් ශාන්ති. ශබ්දය අභිබවා යාමට, එනම් නිවහනට යාමට උත්සාහ දරන ආධ්‍යාත්මික දරුවන්ට බාබා පැහැදිලි කරනවා. එය සියලු ජීව සත්තාවන්ගේ නිවහනයි. ඔබ දැන් ඔබේ ශරීර අත්හැර ආපසු නිවසට යාමට ඇති බව වටහාගෙන ඇත. පරම පියා කියයි: මා පැමිණියේ ඔබව ආපසු නිවසට රැගෙන යාමටයි. අන්න ඒ නිසායි, ඔබ එම ශරීර වලින්, ශරීර නෑ සබඳතා වලින් ඉක්මවා සිටිය යුත්තේ. මෙය අපිරිසිදු ලොවයි. දැන් නිවසට හරවා යායුතු බව ජීවාත්මයන් දනී. ඔබව පිරිසිදු කිරීමට පරම පියා ඇවිත් සිටී. අපට පාරිශුද්ධ ලොවට නැවත වරක් යාමට ඇත. ඔබේ ඇතුලතින් මෙම ඥාන සාගරය කැලතිය යුතුයි. මෙවැනි සිතිවිලි අන් කවරෙකුටවත් නොතිබෙනු ඇත. සිය කැමැත්තෙන්ම ඔය ශරීර අත්හැර හරවා නිවසට ගොස්, ඉන්පසු නව ලොවට, නව පාරිශුද්ධ සම්බන්ධතා තුළට ඔබ යනවා ඇත. මෙම අවධානය තිබෙන්නේ ඉතාමත් සුළු පිරිසකටයි. පරම පියා කියයි: බාල, පරිණත සහ මහළු යන සියල්ලන්ම පාහේ ආපසු නිවසට ගොස් අනතුරුව නව ලොවට, නව සම්බන්ධතා තුළට යනවා ඇත. ඔබ නිවසට යාමට ලැහැස්ති වෙමින් සිටිනවා යන්න ඔබේ බුද්ධිය තුළට යළි යළි ආ යුතුයි. යම් දෙයක් සිදුකල අය ආපසු යන්නේ බාබා සමගයි. දෙවියන්ගේ නමින් දැන් යම් දෙයක් කල අය නව ලොවෙහි කෝටිපතීන් වනවා ඇත. පරණ ලොවේ ඒ මිනිස්සු සියලු දේ වක්‍රව සිදු කරනවා. ඔවුන්ට එහි ඵලය දෙවියන් ලබා දෙනවා ඇතැයි ඔවුන් විශ්වාස කරති. ඔවුන්ට ලැබෙන්නේ තාවකාලික ඵලයයි කියා ඔබට දැන් පරම පියා කියනවා. මා ඇවිත් දැන් ඔබට අවවාද කරනවා: දැන් දෙන අයට කෝටි වාරයකින් ඒවායේ ඵලය උපත් 21කට ලැබේවි. ඔබ එහි ගොස් උපදින්නේ ඉතා විශිෂ්ට නිවෙස් වලයි, නැතිනම්, ඔබ නාරායන් හෝ ලක්ෂ්මී බවට පත්වේවි. එමනිසා, ඔබටත් බොහෝ සේ උත්සාහ දැරීමට සිදුවෙනවා. මේ පරණ අපිරිසිදු ලොව අත්හැරීමට අප සූදානම් වෙමින් සිටිනවා. අප පරණ ලොවත් මේ පරණ ශරීරත් අත්හරින්න ඕන. අවසානයේ කිසිවකුත් සිහිපත් නොවන තරමට ඔබ ඒ තරමින් සූදානම් විය යුතුයි. ඔබ පරණ ලොව හා ඔබේ ඥාති මිත්‍රයන් සිහිපත් කලොත් ඔබේ තත්ත්වය කුමක් වනු ඇත්ද? මෙසේ කියා තිබෙයි: අවසානයේ දී කාන්තාවක් සිහිපත් කළ අයට.......මේ නිසයි, ඔබ පියා අනුගමනය කළ යුත්තේ. බාබා ඔහු මහළු වූ නිසා ශරීරය අත්හරිනවා කියා සිතුවා නොවෙයි. ඔබ සැවොම මහළුයි: මෙය සැමගේම විශ්‍රාමික අවධියයි. සැවොම නිවසට හරවා යා යුතු වේ. එහි ඔබ සිටිනතාක් කල් සිටීවි. අනතුරුව ඔබේ කොටස කිරීමට ඇත, අනතුරුව ශරීරයක් ගෙන ඔබේ කොටස රඟපානවා. ඇතැම් අය පුරා වසර 5000න් වසර සියයක අඩු කාලයක් වන තෙක්ම ශාන්ති දනව්වේම සිටිති. ඒ අය පැමිණෙන්නේ අවසානයේ දීය. සමහරු කාසියේ තමන්ව බිලි දෙනවා, ඒ ඔවුන්ගේ පාප සියල්ලක්ම නැතිවී යනවා ඇතැයි කියාය. අවසානයේ දී පැමිණෙන්නන් විසින් කොපමණ පව් රැස්කර ගෙන තිබෙයි ද? ඔවුන් ඇවිත් යන්න යනවා. නමුත් කිසිවකුටත් සදාතනික මුක්තිය ලබාගත නොහැකියි. ඔවුන් එහි ඉඳිමින් කුමක් කරන්නද ? ඔවුන්ට අනිවාර්යයෙන්ම තමන්ගේ කොටස් කිරීමට ඇත. ඔබට කොටස් ඇත්තේ මුල සිට පැමිණීමටයි. ඉතින් පියා කියනවා: දරුවනි, නොකඩවාම මේ පරණ ලොව අමතක කරන්න. ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. උපත් 84ක කොටස් දැන් අවසන් වී ඇත. ඔබ අපිරිසිදු වී ඇත. ඔබ දැන් තමන්ව ජීවාත්මයන් යැයි සැලකිය යුතුයි, එසේම, පියාව සිහිපත් කරන්න. දිව්‍යමය ගුණධර්ම උකහාගන්න. පරම පියා පැහැදිලි කරනවා: දරුවනි, නොකඩවා තමන්ව පරීක්ෂා කරන්න: මා තුළ නපුරු ගති ස්වභාවයක් තිබේ ද? ඔබේ ගති ස්වභාවය දිව්‍යමය විය යුතුයි. මේ සඳහා වාර්තාවක් (චාර්ට්) තබාගන්න. එවිට එය ස්ථිර බවට පත්වේවි. කෙසේ වෙතත්, මායා එවැන්නියක්, ඇය ඔබට වාර්තාවක් තබාගන්න ඉඩ නොදෙයි. ඔබ එය දින දෙකක් හෝ හතරක් තබා පසුව අත්හරින්නේ ඔබේ වාසනාවේ එය නොතිබෙන නිසායි. එය ඔබේ වාසනාවේ ඇත්නම්, ඔබ ඉතා හොඳින් වාර්තාව තබා ගනී. පාසලක වාර්තා සටහන් අනිවාර්යයෙන් තබනවා. මෙහිත්, එසේම සියලු මධ්‍යස්ථාන වල ඔබ සැවොම වාර්තා සටහන් හෝ ඔබට චාර්ට් එකක් තබාගත යුතුයි. ඉන්පසු දිනපතා එසේ යෙදෙනවාද කියා ඔබව පරීක්ෂා කරන්න. මා දිව්‍යමය ගුණධර්ම ධාරණය කරනවා ද? සහෝදර සහ සහෝදරිය යන සම්බන්ධතාවයටත් වඩා ඉහළින් ඔබ යා යුතුයි. සහෝදරත්වය යන ආධ්‍යාත්මික දැක්ම පමණයි තිබිය යුත්තේ. මා ජීවාත්මයක්, කිසිම දුෂ්ට බැල්මක් නොතිබිය යුතුයි. සහෝදර සහෝදරියන් යන සම්බන්ධතාවය ඇත්තේ ඔබ බ්‍රහ්මකුමාර් සහ බ්‍රහ්මකුමාරියන් වූ නිසායි. ඔබ එක් පරම පියාගේ දරුවන් වේ. මේ සංගම යුගයේ දී පමණයි සහෝදර සහෝදරියන් යන සම්බන්ධතාවය තිබෙන්නේ ඉන් පාප බැල්ම අවසන් වී යයි. ඔබ සිහිපත් කළ යුත්තේ ඒකායන පියාවයි. ඔබ ශබ්දය අභිබවා යන්න ඕන. මේ අයුරින් ඔබටම කතා කිරීම සූක්ෂමව ඉගෙන ගැනීමයි. ශබ්ද නැඟීමේ අවශ්‍යතාවයක් නැත. ඔබට පැහැදිලි කිරීම සඳහායි බාබා ශබ්දය තුළට පැමිණෙන්නේ. ඔබව ශබ්දය අභිබවා ගෙන යාම සඳහා ඔහුට පැහැදිලි කිරීමටත් සිදුව තිබේ. ඔබ දැන් නිවසට හරවා යා යුතුව ඇත. ඔබව රැගෙන යන්නැයි කියා ඔබ ඔහුට කන්නලව් කළා: අප අපිරිසිදු නිසා අපට නිවසට යා නොහැකියි. මේ අපරිසිදු ලොවේ අපව පාරිශුද්ධ කළ

හැක්කේ කාට ද? රිෂිවරුන්, මුණිවරුන් හා සාන්තුවරුන් ආදීන්ට ඔබව පාරිශුද්ධ කිරීම කළ නොහැකියි. ඔවුනුත් පිරිසිදු වන්නට ගංගා නදියෙහි ගොස් ස්නානය කරනවා. ඔවුනුත් පරම පියාව නොදනී. පෙර චක්‍රයෙහි ඔහුව දැන සිටි අයයි දැන් උත්සාහ කරන්නේ. මේ උත්සාහය කිරීමට ඔබව උනන්දු කරවන්නේ පරම පියා හැර අන් කිසිවකු නොවේ. අති උසස්ම කෙනා පරම පියායි. එවන් වූ පරම පියා ගල් මුල් වල සිටිනවා කියූ මිනිසුන්ගේ තත්ත්වය දෙස බලන්න. ඔවුන් දිගින් දිගටම ඉනිමගෙන් පහළට බසිනවා. එක් පැත්තකින් සම්පූර්ණයෙන් පාපයෙන් තොර වූවන් සිටී, අනෙක් පැත්තෙන් සම්පූර්ණයෙන් පාපතර අය සිටී. පෙර චක්‍රයේ මේවා පිළිගත් අයමයි දැනුත් පිළිගන්නේ, මෙහි පැමිණෙන සෑම කෙනෙකුටම පියා ගැන කීම ඔබේ වගකීමයි. ඉනිමං පින්තූරය පැහැදිලි කරන්න. සැමගේම විශ්‍රාමික අවධිය මෙය වේ. සෑම කෙනෙක්ම සාම දේශයට හෝ සතුටු දේශයට යනවා ඇත. බුද්ධි යෝගාවේ බලයෙන් තමන්ව සම්පූර්ණයෙන්ම පාරිශුද්ධ කළ ජීවාත්මයන් සතුටු දේශයට යනවා ඇත. භාරතයේ පුරාතන යෝගාව සිහිපත් කෙරේ. දැන් ජීවාත්මයට ද තමා මුලින්ම පැමිණි බවත් දැන් ආපසු යා යුතු බවත් සිහිපත් වේ. ඔබේ කොටස් දැන් ඔබට සිහිපත් වෙනවා. මේ කුලයට අයත් නොවන්නන් හට පාරිශුද්ධ විය යුතු යැයි සිහිපත් නොවේ. පාරිශුද්ධ වීම සඳහා ඔබ උත්සාහ කළ යුතු වේ. පරම පියා කියනවා: තමන් ජීවාත්ම යැයි සලකමින් මා සිහිපත් කරන්න. එවිට ඔබ පාප ජයගත්තන් වී තමන් සහෝදර සහෝදරියන් යැයි සලකා ගන්නවා. එවිට ඔබේ බැල්ම වෙනස් වේවි. ස්වර්ණම යුගයේ දී ඔබේ බැල්ම නරක නැත. පරම පියා නොකඩවා ඔබට පැහැදිලි කරනවා: දරුවනී, ඔබ සෑම කෙනෙක්ම තමාගෙන්ම ඇසිය යුතුයි: මා ස්වර්ණම යුග දේවතාවක් ද නැතිනම් යකඩ යුග මනුෂ්‍යයෙක් ද? ඔය දරුවන් ඉතාමත් හොඳ පින්තූර සහ පාඨයන් ආදිය සෑදිය යුතුයි. එක් පින්තූරයක ප්‍රශ්න කළ යුතුයි: ඔබ ස්වර්ණම යුගීයෙක් ද නැතිනම් යකඩ යුගීයෙක් ද? දෙවෙනි පින්තූරයේ තවත් ප්‍රශ්නයක් ඇසිය යුතුයි. මෙම උද්යෝගය සෑම තැන්වලම ඇති කළ යුතුයි. අපවිත්‍ර අයව පවිත්‍ර කිරීමට පරම පියා ඔබට ශ්‍රීමත් දෙනවා. කෙසේ වෙතත්, ඔබේ වැඩ රාජකාරී ගැන මා කුමක් දන්නේ ද? ඔබ පියාට කතා කළා, පැමිණ මනුෂ්‍යයන් දේවතාවන් බවට වෙනස් කරන මාර්ගය පෙන්වන්න කියා. මා පැමිණ ඔබට මෙය පෙන්වූවා. එය ඒ තරම් සරල දෙයක්! මා ඔබට දුන් සංඥාව ඉතා පහසුයි: මන්මනාභව්! ඔබ තමන්ව ජීවාත්මයන් යැයි සලකමින් මා ස්මරණය කරන්න. මෙහි අර්ථය නොවැටහුණු නිසායි ඔවුන් ගංගා නදියට පාරිශුද්ධකරුවා යැයි කීවේ. පාරිශුද්ධකරුවා පරම පියායි. දැන් මේ සියලු දෙනාගේම ගිණුම් පියවන කාලයයි. ඔබව ඔබේ කර්ම ගිණුම් පියවන්නට සලස්වා මා ඔබව නිවසට රැගෙන යනවා. පරම පියා පැහැදිලි කරන විට ඔබට වැටහෙනවා. නමුත් එය වාසනාවේ නොමැති නම්, ඔබ වැටෙයි. පරම පියා කියනවා: ඔබව සහෝදර සහෝදරියන් යැයි සිතන්න. ඔබට කිසිදා නරක බැල්මක් නොතිබිය යුතුයි. කාමරාගය නම් වූ යක්ෂ ස්වභාවය ඇතැම් අයට ඇත: තවත් අයට තන්හාව නම් වූ යක්ෂ ස්වභාවය ඇත: එමගින් ඔවුන්ට හොඳ කෑමක් දුටුවොත් දැඩි පෙළඹීමක් ඇති කරවයි. යමෙක් බැදපු කඩල විකුණමින් සිටිනවා දුටුවොත් ඔවුන්ට එය කන්නට සිතෙයි. ඉතින්, එම දුර්වලකම හේතුකොට ගෙන එය අනුභව කළොත්, ඉක්මණින් බලපෑමට ලක් වෙනවා සේම ඔබේ බුද්ධිය නරක් වේ. මවත් පියාවත්, එසේම සහතිකයක් දෙන ලද විශේෂ කෙනෙකුවයි ඔබ අනුගමනය කළ යුත්තේ. යග්යාවෙන් දෙන ලද ඕනෑම අහරක් ඉතා සුමිහිරි යැයි සලකමින් ඔබ අනුභව කළ යුතුයි. පෙළඹීමට ලක් නොවිය යුතුයි. යෝගාවත් අවැසියි. යෝගාව නැතිනම්, ඔබ කියාවි, "මම මේ දේ කන්න ඕන, නැතිනම් මම ලෙඩ වෙයි" කියා. ඔබ මෙහි පැමිණියේ දේවතාවරුන් වීමටයි යන්න ඔබේ බුද්ධියේ තිබිය යුතුයි. ඔබ දැන් ආපසු නිවසට ගොස් ඉන්පසු, ළදරුවෙක් වී මවකගේ ගර්භාෂය තුළට යනවා. මවක් ගන්නා ආහාර පාන කුමක් වුවත් ඇගේ කුසේ සිටින ළදරුවාට බලපානවා. එහි නම් මේ දේවල් නොතිබෙයි. එහි සෑම දේම අනර්ඝම ඒවායි. අපගේ මව අපට පෝෂණය ගෙන දෙන අනර්ඝතම ආහාරයි අනුභව කරන්නේ, එහි සියල්ලක්ම අනර්ඝයි. ඔබ උපදින විට ඔබේ ආහාර පාන පිවිතුරුව තිබෙයි. ඔබ සූදානම් කළ යුත්තේ එවන් වූ දිව්‍යලෝකයට යාමටයි. ඔබ පරම පියාව සිහිපත් කළ යුතුයි. පරම පියා ඇවිත් ඔබව ප්‍රාණවත් කරනවා. ඒ මිනිස්සු තරුණ බවට පත්වෙනවා යැයි සිතා වඳුරන්ගේ ඉන්ද්‍රියන් මිනිසුන්ට බද්ධ කරනවා. හරියටම හෘදය වස්තු බද්ධ කරන්නාක් සේ. ඔහු පැමිණ ඔබව වෙනස් කරනවා. ඒ සියලු දේවල් විද්‍යාවයි. ඔවුන් බෝම්බ ආදියත් නිපදවනවා. ඒ සියල්ලක්ම ලෝකය විනාශ කරාවි. ඒවා තමෝප්‍රධාන් බුද්ධීන් වේ. එම දෙවය නිර්මාණය වීම ගැන ඔවුන් සතුටින් සිටී. අනිවාර්යෙන් බෝම්බ සෑදෙන්න ඕන. වේද ග්‍රන්ථ වලත් ඔවුන්ගේ උදරයෙන් මිසයිල මතු වූවා කියාත් අහවල් අහවල් දේවල් සිද්ධ වුණා කියාත් ලියා තිබෙනවා. පරම පියා ඔබට පැහැදිලි කළා, ඒ සැමෙකක්ම භක්ති මාර්ගයට අදාලයි කියා. ඔබට රාජයෝග උගන්වන්නේ මා පමණයි. එය හුදෙක් කතන්දරයක් පමණයි. එයට සවන් දීමෙන් ඔබේ තත්ත්වය ද ඒ බවට පත්වී ඇත. පරම පියා ඔබට දැන් සත්‍ය නාරායන්ගේ කතාව, තෙවන ඇසේ කතාව සහ අමරණීය කතාව කියනවා. මෙම අධ්‍යාපනය අධ්‍යයනය කිරීම මගින් එම තනතුර ලබනවා. කෙසේවෙතත්, ඔවුන් පෙන්වා තිබෙන ආකාරයේ චක්‍රය කරකවමින් සියල්ලන්වම එයින් මරා දමන ක්‍රිෂ්ණා කෙනෙක් නොවෙයි එහි ඇත්තේ. මා ඔබට සරලව රාජයෝග උගන්වා ඔබව පාරිශුද්ධ කරනවා. මා ඔබව ස්වදර්ශන චක්‍රය කරකවන්නන් කරවනවා. ඔවුන් චක්‍රයක් අතැතිව පෙන්වා තිබෙනවා. ඔහු ස්වදර්ශන චක්‍රය කරකවන්නේ කෙසේ ද? එය මැජික් වගේ දෙයක් නොවෙයි. ඒ සැමෙකක්ම අපහාස කිරීමක්. එය අඩ චක්‍රයක් පුරාවට පවතී. නාටකය ඉතාමත් අපූරුයි. දැන් බාල මහළු සියල්ලන්ගේම විශ්‍රාමික අවදිය වේ. අප දැන් නිවසට ආපසු යා යුතු නිසා අප ඒ සඳහා පියා සිහිපත් කළ යුතුයි. අන් කිසිම දෙයක් සිහිපත් කළ නොයුතුයි. එවන් ස්ථිතියක් ඔබට ඇතොත් පමණයි එවන් තත්ත්වයක් ඔබට ලැබෙන්නේ. ඔබේ හදවතින් විමසන්න: මොන තරමින් මගේ චාර්ථා සටහන තිබේද, එය OK ද? ඔබේ චාර්ථාවෙන් ඔබේ කල්ක්‍රියාව කිව හැකියි. ඔබ නිතිපතා ඉගෙන ගන්නවාද නැද්ද කියා. ඇතැම් අය බොරු කියනවා. පරම පියා කියනවා: ඇත්ත කියන්න. නොකීවොත් ඔබේ

වාර්ථාව නරක් වේවි. ඔබ පාරිශුද්ධ වනවා කියා පරම පියාට පොරොන්දු වී තිබෙනවා. ඉතින්, එම පොරොන්දුව කඩ කලොත් ඔබේ තත්ත්වය කුමක් වේවි ද? ඔබ පාපයේ ගැලුනොත් සම්පූර්ණ සෙල්ලම ම අහවර වෙයි. පළමු සතුරා ශරීර අවධානයයි, ඉන්පසු රාගය, ඉන්පසු කෝපය වේ. ශරීර අවධානය තිබූ විට, කෙනෙකුගේ ආකල්පය අපිරිසිදු වේ. මෙන්න මේ නිසායි පරම පියා කියන්නේ: ඔබ ජීවාත්ම අවධානයට පත්වේවා. මොහු අර්ජුනා වේ. ක්‍රිෂ්ණා ජීව සත්තාවත් ඔහුමයි. ඔහු ඇතුල් වන කෙනාගේ නම වෙනස් කර ඇත. ඔහුගේ නම අර්ජුනා නොවෙයි. මිනිස්සු කියන්නේ මේ ශාකය ආදිය ඔබේ මනඃකල්පිත ජීවායි කියායි. ඔබ කුමක් උපකල්පනය කරයි ද, එය යම් අවස්ථාවක දී ඔබ දකීවි. ඔය දරුවන් තමන් දිව්‍යලෝකයට ගොස් නැවතත් කුඩා දරුවන් බවට පත්වනවාය යනුවෙන් බොහෝ සතුටට පත්වන්න ඕන. එවිට ඔබේ නම, රූපය, දේශය සහ කාලය ආදී සියල්ලක්ම අළුත් වේවි. මෙය අසීමිත නාටකය වේ. කල්තියා තියම වූ දෙයම නැවත සිදුවෙනවා. එය සිදුවිය යුතු වේ, ඉතින්, දුක්වන්නේ කුමකට ද? නාටකයේ රහස් දැන් ඔය දරුවන්ගේ බුද්ධිය තුළ ඇත. බ්‍රහමින් වන ඔබ හැරෙන්නට අන් කිසිවකු මෙය නොදනී. මේ කාලයේ ලොවෙහි සියල්ලන්ම පාහේ වඳින්නන් වේ. වඳිනා අය සිටිනාතාක් වඳින්නට සුදුසු එක් පුද්ගලයකු හෝ සිටිය නොහැක. වඳින්නට සුදුස්සන් සිටින්නේ ස්වර්ණිම සහ රිදී යුග වලදීය. යකඩ යුගයේ සිටින්නේ වන්දනාකරුවන්ය. එමනිසා, ඔබව වඳින්නට සුදුස්සන් යැයි කිව හැක්කේ කෙසේ ද? දේවතාවරු පමණයි වන්දනීය වන්නේ. මනුෂ්‍යයන් වන්දනා කරන්නන් වේ. පරම පියා ප්‍රධාන කරුණ පැහැදිලි කරයි: ඔබට පාරිශුද්ධ වීමට අවැසි නම්, සදා මා පමණක් සිහිපත් කරන්න. නාටකය අනුව කෙනෙක් කොපමණ උත්සාහ දරන්නට ඇත්ද, එපමණට ඔහු උත්සාහ කරාවි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය :**

1. ඔබ කෙලෙස ඉගෙන ගන්නවාද යන්නෙහි වාර්තාව තබන්න. ඔබේ වාර්තාවේ දිස්විය යුත්තේ: මට කෙතරම් දුරට සහෝදරත්වයේ බැල්ම තිබේ ද? මාගේ ගති ස්වභාවය දිව්‍යමය වූයේ ද?
2. ඔබේ දිව (රසය සහ ආහාර) මත ඉමහත් පාලනයක් ඇති කරගන්න. ඔබ දේවතාවරුන් බවට පත්වන හෙයින් ඔබේ ආහාරපාන කෙරෙහි විශාල අවධානයක් යොමු කළ යුතු බව ඔබේ බුද්ධියෙහි තිබිය යුතුයි. ඔබේ රස තහර දහකම් නොකළ යුතුයි. ඔබ මවත් පියාවත් අනුගමනය කළ යුතුයි.

**වරදානය:** ඔබ සැම මොහොතම අවසන් මොහොත යැයි සලකා තිව්‍ර උත්සාහවන්තයකු වී සදා සූදානම් සහිතව සිටිත්වා.

ඔබේ අවසන් මොහොත ගැන විශ්වාසයක් නැත, ඒ හෙයින් ඔබ සැම මොහොතම අවසාන මොහොත යැයි සැලකිය යුතු අතර සූදානම් සහිතව සිටින්න ඕන. සූදානම් සහිත වීම යනු තීව්‍ර උත්සාහ දරන්නකු වීමයි. විනාශයට තවත් කාලයක් ඇතැයි කියාත් ඒ වන විට ඔබ සූදානම් වෙනවා කියාත් නොසිතන්න. නැහැ: සැම මොහොතක්ම අවසාන මොහොතයි, ඉතින්, ඔබ නිරන්තරව ඇලීමෙන් නිදහස්ව, පාපී සහ අපත සිතිවිලි වලින් නිදහස්ව සිටි විටයි ඔබ සූදානම් සහිතව සිටිනවා කියා කියනුයේ. මොන කාර්යයක් කිරීමට තිබුණත් කම් නැත, ඔබේ ස්ථිතිය සැමවිට අභිබවා තිබේවා. එවිට සිදුවන ඕනෑම දෙයක් යහපත් වේවි.

**පාඨය :** ඔබ නීතිය ඔබේ අතට ගැනීම අහංකාරයේ සලකුණ තිබීමයි.

***** ඕම් ශාන්ති *****